SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# අදියර I විභාගය - 2021 ජූලි

# යෝජිත උත්තර

# (104) ව්‍යාපාරික පරිසරය (BEN)


**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669



**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අදියර I විභාගය - 2021 ජූලි**

# (104) ව්‍යාපාරික පරිසරය

## යෝජිත උත්තර

| අනිවාර්ය ප්‍රශ්න 20 කි<br>(මුළු ලකුණු 40) | **A කොටස** |
|---|---|

***පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

**1.1** (2)

**1.2** (1)

**1.3** (4)

**1.4** (1)

**1.5** (4)

**1.6** (2)

**1.7** (3)

**1.8** (3)

**1.9** (1)

**1.10** (2)

aat SRI LANKA

***(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20 කි)***

**1.11** අසත්‍යයි

**1.12** සත්‍යයි

**1.13** අසත්‍යයි

**1.14** සත්‍යයි

**1.15** අසත්‍යයි

***(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10 කි)***

**1.16** 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගම් වර්ග

- සීමා රහිත සමාගම්
- සීමා සහිත සමාගම් (පෞද්ගලික සමාගම්, පොදු සමාගම්, අක්වෙරළ සමාගම්)
- ඇපයෙන් සීමිත සමාගම්

***(ලකුණු 02 යි)***

**1.17 විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම**

භාණ්ඩ හා සේවා හුවමාරු වීමේ දී අතරමැදියෙකු වශයෙන් ක්‍රියා කිරීම යන්න මෙහි අදහසයි. වෙනත් අයුරකින් කිවහොත් ඕනෑම භාණ්ඩයක් හෝ සේවයක් මුදල් සඳහා ද මුදල් ඕනෑම භාණ්ඩයක් හා සේවයක් සඳහා ද හුවමාරු කර ගත හැකි බවය. මෙය මුදලක ප්‍රධානතම මෙන්ම වැදගත්ම කාර්යයකි.

***(ලකුණු 02 යි)***

**1.18 චෙක්පත් පිටසන් කිරීම**

පිටසන් කිරීම යනු චෙක්පතෙහි සඳහන් වන ආකාරයට ම ආදායකයා සිය නම ගලායන පරිදි චෙක්පත පිටුපස ලිවීමයි. මෙහි දී ආදායකයාගේ නම ලියනවා මිස ඔහුගේ අත්සන යෙදීම අවශ්‍ය නැත. ආදායකයෙකු නොවන අයෙකුට වුව ද අන් අයෙකුට පැවරීමේ දී ඔහුගේ නම ලිවීම සිදු කල යුතුය. මෙහි දී සිදු වන්නේ චෙක්පතෙහි අයිතිය පැවරීමයි නැතිනම් අයිතිය අහෝසි කිරීමයි එනම් තම හිමිකම පැවරුම්ලාභියාට ආදායකයා විසින් පැවරීමයි.

***(ලකුණු 02 යි)***

**1.19 කාන්තා ව්‍යවසායකත්වය මුහුණ දෙන අභියෝග**

1) නිවසේ කටයුතු සඳහා වැඩි කාලයක් කැප කළ යුතු වීම.

2) ඇතැම් ජන කොටස්වල පවතින එදිරිවාදී ආකල්ප.

3) පහසුකම් සපයන ආයතන තුළ කාන්තාවන්ට ඇති අඩු පිළිගැනීම.

4) ඇතැම් රටවල නිති රීති මගින් ඇති කරන පීඩනය.

5) රජයේ දිරිගැන්වීම් ප්‍රමාණවත් නොවීම.

6) පුරුෂාධිපත්‍ය සංකල්පය තුළ මුල් බැසගෙන තිබීම.

7) ස්ත්‍රී පුරුෂ අසමානතාවය.

8) අසාර්ථක වීමේ බිය.

9) ප්‍රාග්ධනය නොමැතිකම.

10) විශ්වාසය නොමැතිකම.

***(ලකුණු 02 යි)***

**1.20 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු**

1) ආර්ථික සහ මිල ස්ථායිතාව ඇති කිරීම

2) මූල්‍ය අංශයේ / ක්‍රමයේ ස්ථායීතාවය ඇති කිරීම

***(ලකුණු 02 යි)***

***(මුළු ලකුණු 40 යි)***

***A කොටසෙහි අවසානය***

SRI LANKA

**(මුළු ලකුණු 40 යි)** **B කොටස**

***දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

***පරිච්ඡේදය 01 (II) - ව්‍යාපාර සංකල්ප හා විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග***

**(a) සීමාසහිත පෞද්ගලික සමාගම් වල ප්‍රධාන ලක්ෂණ**

| | | |
|---|---|---|
| 1 | අයිතිය | කොටස්කරුවන් සතු වීම. |
| 2 | ප්‍රාග්ධනය | කොටස් නිකුත් කිරීමෙන් සපයා ගනී. ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කිරීම තහනම් වන අතර නිදහසේ කොටස් පැවරීමට නොහැකිය. |
| 3 | කොටස්කරුවන් සංඛ්‍යාව | අවමය 01 උපරිමය 50 |
| 4 | කළමණාකරණය | අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් සිදුවේ. අවමය 01 වන අතර උපරිමය සීමාවක් නැත. |
| 5 | පාලනය | ව්‍යවස්ථාපිත පාලනයට හා කොටස්කරුවන්ගේ සාමුහික පාලනයට යටත් වේ. |
| 6 | නෛතික පුද්ගලභාවය | නෛතික පුද්ගලභාවයක් ඇත. |
| 7 | වගකීම | සීමාසහිත වේ. |
| 8 | පැවැත්ම | අඛණ්ඩ පැවැත්මක් ඇත. |
| 9 | සංස්ථාපනය | සමාගම් පනත අනුව සංස්ථාපනය අනිවාර්ය වේ. |
| 10 | ගිණුම් තැබීම හා විගණනය | අනිවාර්යය වේ. නමුත් ගිණුම් වාර්තා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන්නේ ඉල්ලා සිටියොත් පමණි. |
| 11 | බදු ගෙවීම | සමාගම නමින් බදු ගෙවිය යුතුය. |
| 12 | ඈවර කිරීම | ස්වේච්ඡාවෙන්, අධිකරණ නියෝගයකින් හා අධිකරණයේ අධික්ෂණය යටතේ ඈවර කිරීම කළ හැක. |
| 13 | සමාගමේ නාමය | සමාගමේ නම සඳහන් කිරීමේ දී නමේ මුලට "සීමාසහිත" යන වචන හෝ එහි කෙටි යෙදුම වන "සී/ස" යන්න සහ අගට යෙදෙන "සමාගම" යන වචනයට පූර්වයෙන් "(පෞද්ගලික)" යන වචනය හෝ එහි කෙටි යෙදුම වන "(පෞද්)" යන්න යෙදිය යුතුයි. |
| 14 | ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම | ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයකින් තොරව සියළුම කොටස්කරුවන්ගේ කැමැත්ත මත ලාභාංශ බෙදා හැරිය හැකිය. |
| 15 | සම්බන්ධතා රෙජිස්ටරය පවත්වා ගැනීම | කොටස්කරුවන්ගේ ඒකමතික යෝජනා සම්මතයකින් අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම සමග කරන ගනුදෙනු විස්තරාත්මකව දැක්වෙන සම්බන්ධතා රෙජිස්ටරය පවත්වාගෙන යාමෙන් වැළකිය හැකිය. |

***(ලකුණු 04 යි)***

**(b) සීමාසහිත පෞද්ගලික සමාගම් වල වාසි**

1 අයිතිය පවුලේ ඥාතීන් හිතවතුන් අතරේ පවත්වාගෙන යා හැකි වීම.

2 සමාගමේ පාලන බලය සීමිත පිරිසක් අතරේ රඳවා ගැනීමට හැකි වීම.

3 ලාභය සීමිත පිරිසක් අතරේ බෙදා ගැනීමට හැකි වීම.

4 වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම.

5 වගකීම සීමිත වීම.

6 නීතිමය පුද්ගලභාවයක් පැවතීම.

7 පොදු සමාගම්වලට සාපේක්ෂව නීතිමය බලපෑම අඩු වීම.

8 අඛණ්ඩ පැවැත්මක් හිමි වීම.

9 අධ්‍යක්ෂක මණ්ඩලය මගින් කළමනාකරණය නිසා කළමනාකරණය කාර්යක්ෂම වීම.

10 කොටස්කරුවන් සියලු දෙනාගේ ඒකමතික යෝජනා සම්මතයකින් රැස්වීම් පැවැත්වීමෙන් තොරව සමාගමේ බොහෝ කටයුතු ඉටුකිරීමේ හැකියාව ලැබීම.

11 ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයකින් තොරව කොටස් හිමියන් වෙත ලාභාංශ බෙදා හැරීමට හැකි වීම.

12 විවිධ බදු සහන ලැබීමේ හැකියාව.

*(ලකුණු 03 යි)*

**(c)**

1 වඩා හොඳ සහ ඉක්මන් තීරණ ගැනීම.

2 නිෂ්පාදන ඵලදායිතාව වැඩි කිරීම.

3 වැඩිදියුණු කළ පාරිභෝගික සේවාව.

4 පාර්ශ්වකරුවන් සමඟ වැඩි සහයෝගීතාවය.

5 වැඩිදියුණු කළ මූල්‍ය කාර්ය සාධනය.

6 අඩු පරිපාලන පිරිවැය.

7 අඩු අධීක්ෂණ පිරිවැය.

8 තොරතුරු යැවීමට/බෙදා ගැනීමට වඩා ඉක්මන් වන නිසා කාලය සහ මුදල් ඉතිරි කර ගත හැක.

9 සමාජ මාධ්‍ය ජාල භාවිතා කළ හැකි අතර එය ව්‍යාපාරයේ අලෙවිකරණ මෙවලමක් ලෙස භාවිතා කළ හැකිය.

10 වසරේ සෑම මිනිත්තුවකම සන්නිවේදනය සඳහා වෙබ් අඩවි විශාල වශයෙන් ලබා ගත හැකි වීම.

11 සංස්කෘතික පරතරය පියවීම. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට වැඩි ප්‍රවේශයක් ලැබීම තුලින් සංස්කෘතීන් අතර සහයෝගය ගොඩනැගීමට සහ තොරතුරු හා අදහස් හුවමාරු කර ගැනීමට ඔවුන්ට අවස්ථාව ලබා දී ඇත.

12 අපනයන වෙළඳපොලේ භාවිත වන නව තාක්ෂණය ගැන ඉගෙන ගැනීමට එය භාවිත කළ හැකිය.

13 එය පහසුවෙන් ගෙවීම් කිරීමට භාවිත කළ හැකිය.

14 නිවැරදි තීරණයක් ගැනීමට උපකාර කළ හැකිය.

*(ලකුණු 03 යි)*
*(මුළු ලකුණු 10 යි)*

## තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

| පරිච්ඡේදය 03 - ව්‍යාපාර උපකාරක සේවා |
| --- |

**(a) සඵලදායී සන්නිවේදනයට එල්ලවන බාධා**

1 **භෞතික සාධක** - ශබ්ද, කැරලි කෝලාහල, අනතුරු
2 **පද්ධතියේ වැරදි අඩුපාඩු** - දත්ත පද්ධතිය තුළ පවතින අඩුපාඩු, අන්තර්ජාල ගැටලු
3 **සෘණාත්මක සිතුවිලි** - නවීන තාක්ෂණික සන්නිවේදන ක්‍රම පිළිබඳව සේවකයන් තුළ පවතින සෘණාත්මක සිතුවිලි
4 **මනෝවිද්‍යාත්මක සාධක** - විවිධ පුද්ගලයින් සන්නිවේදනය කරන අවස්ථාවන්හි දී විවිධ මානසික තත්ත්ව යටතේ සිටිය හැකිය එබැවින් සියල්ලන්ට ම එක හා සමාන සඵලදායකත්වයෙන් යුතුව සන්නිවේදනය කිරීමට අවස්ථාව නොලැබේ
5 **භාෂාව හා සංස්කෘතිකමය විවිධත්වය** - අවබෝධ කර ගැනීමේ ශක්තිය අඩු වේ
6 **සෞඛ්‍යමය ආබාධ**

*(ලකුණු 03 යි)*

**(b)**

1 අවදානම වෙනත් පාර්ශ්වයකට බෙදිය හැකිය.
2 ගින්නෙන් හෝ වෙනත් සිදුවීමකින් ගොඩනැගිලි, කර්මාන්තශාලා සහ වෙනත් දේපළවලට සිදු වූ හානි සඳහා වන්දි.
3 සොරුන්ගෙන් භාණ්ඩ හා මුදල් හානි සඳහා වන්දි.
4 ලැබිය යුතු මුදල් නොලැබීමේ අවදානම පිළිගැනීම.
5 නිෂ්පාදන වගකීම්, සේවක වගකීම් සහ මහජන වගකීම් සඳහා රක්ෂණ ආවරණය.
6 රටේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය ආයෝජන සඳහා සහාය වීම.
7 එය ව්‍යාපාරයේ දායකත්වයට බලපෑමක් ඇති කරයි.
8 එය ජාත්‍යන්තර වෙළඳාමේ දියුණුවට උපකාරී වේ.
9 එය හොඳ ආයෝජන මාර්ගයක් වන අතර අවිනිශ්චිතතාවයෙන් වැළකී සිටියි.
10 මුල්‍ය පාඩු අවම කර ගැනීමට උපකාරී වේ.
11 අඛණ්ඩව ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමට උපකාරී වේ.
12 ව්‍යාපාරයේ සේවකයින් ආරක්ෂා කරයි.
13 සේවකයින් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට උපකාරී වේ.

*(ලකුණු 03 යි)*

at SRI LANKA

**(c)** **1) රක්ෂ්‍ය හිමිකම**

රක්ෂණය කරනු ලබන විෂය වස්තුව (පුද්ගල/දේපල) පිළිබඳව රක්ෂණ ඔප්පුව ලබා ගන්නාට හිමිකමක් තිබිය යුතුය යන්න මෙහි අදහස ය. කිසියම් වස්තුවකට රක්ෂණීය හිමිකමක් ඇති වීමට නම් පහත සඳහන් ලක්ෂණ තිබිය යුතු යි.

- අදාළ ජීවිතය හෝ දේපල පැවතීමෙන් වාසියකුත් එය විනාශ වීමෙන් අවාසියකුත් සිදුවීම.
- ලබන වාසිය හෝ අවාසිය මුදලින් ගණනය කල හැකි වීම.
- රක්ෂිතයා හා දේපළ අතර සම්බන්ධතාවය නීතිමය වශයෙන් ඔප්පු කළ හැකි වීම.

**2) උපරිම විශ්වාසය**

මෙයින් අදහස් කරන්නේ රක්ෂණ ඔප්පුවකට ඇතුළු වන සියලුම පාර්ශ්වයන් විෂය කරුණු සම්බන්ධයෙන් වැදගත් යැයි සැලකෙන සියලුම කරුණු පිළිබඳව සම්පූර්ණ සහ නිවැරදි කරුණු සැපයිය යුතු බවයි. එනම් දෙපාර්ශ්වයම සියලු කාරණා හෙළිදරව් කරනු ඇතැයි යන විශ්වාසය උපරිම සද්භාවයේ මූලධර්මය ලෙස හැඳින්වේ.

**3) හානි පුරණය**

මෙයින් අදහස් කරන්නේ කිසියම් රක්ෂිත දේපලකට හානියක් (අලාභයක්) සිදු වු විට එම දේපල යථා තත්ත්වයට පත් කිරිමට ප්‍රමාණවත් වන්දියක් පමණක් ගෙවන බවයි. රක්ෂණයේ මෙම මූලධර්මය රක්ෂණකරුවන් ලාභ ලැබීම වළක්වයි. එසේම, මෙය ජීවිත රක්ෂණයට අදාළ නොවේ.

**4) දායකත්වය**

රක්ෂණයේ දායකත්ව මූලධර්මය යනු යම් පුද්ගලයෙක් එකම අවධානමක් ආවරණය කිරීම සඳහා රක්ෂණ සමාගම් කිහිපයකින් රක්ෂණ ඔප්පු මිලදී ගෙන තිබේ නම් (ද්විත්ව රක්ෂණය) අදාළ දේපල සඳහා අලාභයක් වු විට රක්ෂණ ඔප්පු නිකුත් කර ඇති සියලුම ආයතනවල රක්ෂණ ඔප්පු වටිනාකමේ අනුපාතිකයන්ට අනුව වන්දි ගෙවීම සිදු කිරීමයි. මෙම මූලධර්මයෙන් රක්ෂණය මගින් ලාභ ඉපයීම වලක්වන අතර මෙය ජීවිත රක්ෂණයට අදාළ නොවේ.

**5) ආදේශනය**

යම් දේපලකට හානි වු විට ඒ සම්බන්ධව වන්දියක් ලබා ගත් අවස්ථාවක රක්ෂිතයාට මේ පිළිබඳ වෙනත් බාහිර පාර්ශ්වයන්ගෙන් ලබාගත හැකි වාසි හා සියලුම අයිතින් අදාළ රක්ෂකයාට පැවරීම මින් අදහස් කරයි. ජිවිත රක්ෂණයට මෙය බල නොපාන අතර මෙම මූලධර්මය නිසාද රක්ෂණයෙන් ලාභ ලැබිම වළක්වනු ලබයි.

**6) ආසන්න හේතුව**

රක්ෂිත දේපලකට හානි සිදු වු විට බැලු බැල්මට එම හානිය සිදු විමට හේතු කිහිපයක් තිබිය හැකිය. එම හේතු අතරින් ආසන්නතම හේතුව රක්ෂණ ඔප්පුවෙන් ආවරණය විය යුතුය යන්න මෙහි අදහසයි. වෙනත් ලෙසකින් කිවහොත් හානිය සිදු වීමට බලපාන ලද ප්‍රධානතම හේතුව රක්ෂණ ඔප්පුවෙන් ආවරණය විය යුතු බව මෙම මුලධර්මයෙන් කියවේ.

***(ලකුණු 04 යි)***
***(මුළු ලකුණු 10 යි)***

SRI LANKA

## හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 04 - ව්‍යාපාර සංවිධානවල වෙළෙඳාම**

**(a)**

1) ජල මාර්ග - නැව් / යාත්‍රා

2) ගුවන් මාර්ග - ගුවන් යානා

*(ලකුණු 02 යි)*

**(b)**

1 වෙළෙඳපොළ පුළුල් කිරීමට අවකාශය උදා වීම.

2 තොග සහ ලේඛන කටයුතු අඩු වීම.

3 අතරමැදි පිරිවැය අඩු වීම.

4 වෙළඳපොළ අවකාශය සහ පාරිභෝගික අවකාශය පුළුල් කිරීමට හැකි වීම.

5 ව්‍යාපාර බාධා අවම වීම.

6 දවසේ ඕනෑම වේලාවක ව්‍යාපාර කිරීමේ හැකියාව.

7 ආරම්භක පිරිවැය අඩු වීම.

8 නව අයිතම භාවිත කිරීමට අවස්ථාව උදා වීම.

9 ව්‍යාපාර වේගවත් වීම.

10 මිනිසුන් අතර භාවිතයේ පහසුව.

11 ගනුදෙනුකරුවන්ගේ කාලය සහ ශ්‍රමය ඉතිරි වීම.

*(ලකුණු 04 යි)*

**(c)**

| ලියවිල්ල | අරමුණ |
|---|---|
| **නාමික ඉන්වොයිසිය** | මෙය ආනයනකරු විසින් තහවුරු කිරීම සඳහා භාණ්ඩ පිළිබඳ තොරතුරු සැපයීමයි. භාණ්ඩවල මිල, ප්‍රමාණය, ප්‍රවාහන මාධ්‍ය, භාණ්ඩ ප්‍රවාහන පිරිවැය සහ බෙදා හැරීමේ ආකාරය, රක්ෂණය සහ පැටවීමේ දිනය, භාණ්ඩයේ බර, ඇසුරුම් වර්ගය, පෙට්ටි ප්‍රමාණය, ලබා දෙන මිල සහ අදාළවන දිනය යන තොරතුරු අන්තර්ගත වේ. |
| **වාණිජ්‍ය ඉන්වොයිසිය** | භාණ්ඩ මිල හා අපනයනකරු විසින් දරන ලද අනෙකුත් වියදම් පිළිබඳ සන්නිවේදනය කරනු ලබන අවසාන ඉන්වොයිසියයි. |
| **ප්‍රභවස්ථාන සහතිකය** | මෙය වෙළෙඳාම් කරනු ලබන භාණ්ඩ නිෂ්පාදනය කරන ලද රට තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය වේ. භාණ්ඩවල අයිතිය ලබා ගැනීම සඳහා හිමිකමෙහි සාක්ෂියක් ලෙස මෙහි සත්‍ය පිටපතක් ආනයනකරුට අවශ්‍ය වේ. |
| **නෞභාරපත** | භාණ්ඩ නැව්ගත කරන්නා හා නැව අතර එළඹුණු ගිවිසුම තහවුරු කර ගැනීම සඳහා මෙම ලියවිල්ල අවශ්‍ය වේ. භාණ්ඩවල අයිතිය ලබා ගැනීම සඳහා හිමිකමෙහි සාක්ෂියක් ලෙස මෙහි සත්‍ය පිටපතක් ආනයනකරුට අවශ්‍ය වේ. |

aat SRI LANKA

| | |
|---|---|
| **රක්ෂණ සහතිකය** | අන්තර්ජාතික සීමාව හරහා ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ සඳහා ප්‍රමාණවත් රක්ෂණයක් ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීම සඳහා මෙම ලියවිල්ල වැදගත් වේ. |
| **ඉන්ඩෙම්නිටි ලියුම** | නැව්ගත කරන ලද භාණ්ඩවලට අදාළ කිසියම් භව්‍ය හානියක් පිළිබඳව වු අවධානම අපනයනකරු විසින් භාර ගන්නා බවත් එම නිසා පිරිසිදු නෞභාරපතක් නිකුත් කරන ලෙසටත් නැවෙන් කරන ලද බවටත් තහවුරු කරමින් නිකුත් කරන ලියවිල්ල වේ. |
| **සනීපාරක්ෂණ සහතිකය** | මෙය භාණ්ඩවල තත්ත්වය තහවුරු කිරීම සඳහා වන අතර ඇතැම් භාණ්ඩ අපනයනය කරන රටෙහි බලයලත් නියාමන ආයතනයකින් නිෂ්කාශනය අවශ්‍ය විය යුතුය. |

***(ලකුණු 04 යි)***

***(මුළු ලකුණු 10 යි)***

## පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

| *පරිච්ඡේදය 07 - ව්‍යවසායකත්වයේ දායකත්වය* |
|---|

**(a)**

| ව්‍යවසායකයා | ව්‍යවසායකයෙකු නොවන ව්‍යාපාරිකයා |
|---|---|
| තමාගේ අදහස් හා නව සංකල්පයන් අනුව ව්‍යාපාරය අරඹයි. | පවතින අදහසක් හෝ සංකල්පයක් අනුව ව්‍යාපාරය අරඹයි. |
| ව්‍යාපාරික ප්‍රතිවාදියා වන්නේ තමාමය. | අනෙකුත් ව්‍යාපාර ප්‍රතිවාදීන් වේ. |
| නව ව්‍යාපාර අවස්ථා කෙරෙහි අවධානය යොමු කරයි. | නිතරම තමාගේ ව්‍යාපාර කටයුතුවල නිරත වේ. |
| නවෝත්පාදකයෙකි. | සාම්ප්‍රදායකයෙකි. |
| අවධානමට මුහුණ දෙයි. | ගැටලු මගහැර අධෛර්යයට පත් වෙයි. |
| ගැටලු ඇති වූ විට ඒවා පිටු දැකීමට ධෛර්යමත්ව කටයුතු කරයි. | වෙනත් අයෙකු විසින් දකින ලද අවස්ථා භාවිත කරයි. |
| නව ව්‍යාපාරික අවස්ථා දකියි. | වෙනත් අයෙකු විසින් දකින ලද අවස්ථා භාවිත කරයි. |

***(ලකුණු 03 යි)***

| *පරිච්ඡේදය 06 - ආර්ථික කොඳුනාරටිය ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර* |
|---|

**(b)**

**කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෙකු ලෙස සමන්ගේ ව්‍යාපාරයේ කාර්ය සාධනය වැඩිදියුණු කළ හැකි ක්‍රම කිහිපයක් පහත සඳහන් වේ.**

**▪ පරිසරය සක්‍රිය කිරීම**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා හිතකර පරිසරයක් රජය විසින් ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපාර කිරීමේ පහසුව වැඩි දියුණු කිරීම කළ යුතුය. මේ සඳහා තරගකාරීත්වය සහ සහයෝගය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති සැකසීම, නියාමන සහ ආයතනික රාමුව, සම්බන්ධීකරණය සරල කිරීම සහ ක්‍රියා පටිපාටි තාර්කික කිරීම කළ හැකිය.

**▪ නවීන සුදුසු තාක්ෂණය**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ගුණාත්මක, නව්‍ය නිෂ්පාදන සහ තරගකාරී නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා නවීන සහ සුදුසු පිරිසිදු තාක්ෂණයන් අත්පත් කර ගැනීමට සහ ඒවා භාවිත කිරීමට රජය පහසුකම් සැලසිය යුතුය. කලාපීය කාර්මීකරණය කෙරෙහි අවධානය යොමු කරන අතරම දැනුම පදනම් වූ, තාක්ෂණික තීව්‍ර කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා යොමු කිරීම සඳහා කාර්මික ප්‍රතිපත්ති සකස් වී ඇත.

**▪ ව්‍යවසායක සංස්කෘතිය සහ නිපුණතා සංවර්ධනය**

රජය විසින් පාසල්, විශ්වවිද්‍යාල, තාක්ෂණික හා වෘත්තීය පුහුණු ආයතනවල ව්‍යවසායකත්ව සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැලසීම, ධාරිතාව ගොඩනැංවීම සහ තරුණ හා කාන්තා ව්‍යවසායකත්වය කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. එසේම කුඩා හා මධ්‍ය පරිමාණ

ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ පුහුණුවක් සහ කුසලතා සංවර්ධනයක් සපයන ආයතනවල ධාරිතාව ශක්තිමත් කළ යුතුය.

■ **මූල්‍ය සඳහා ප්‍රවේශය**
බැංකු, මූල්‍ය ආයතන හරහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා පහසු සහ දැරිය හැකි ලෙස මුදල් ලබා ගැනීමේ යාන්ත්‍රණයන් සඳහා රජය විසින් පහසුකම් සැපයිය යුතු අතර එම යාන්ත්‍රණ ශක්තිමත් කළ යුතුය. සෑම බැංකුවකටම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය ලබා දීම සහ පුළුල් කිරීම සඳහා ක්‍රමවේදයක් තිබිය යුතුය. අරමුදල් ක්‍රම (Angel fund) සහ ව්‍යාපාර විධි විධාන තවදුරටත් ස්ථාපිත කිරීම ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කරනු ඇත.

■ **වෙළඳපොළ පහසුකම් සැපයීම**
ජාත්‍යන්තරකරණයේ වැදගත්කම රජය විසින් හඳුනාගෙන ඇති අතර දේශීය හා අපනයන වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට පහසුකම් සැලසීමට සහාය ලබා දෙනු ඇත.

■ **පර්යේෂණ සහ සංවර්ධන**
නිෂ්පාදන සංවර්ධනය, ක්‍රියාවලි සංවර්ධනය, ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ තරගකාරීත්වය ඉහළ නැංවීමේ අරමුණින් පිරිවැය ඵලදායී නවීන තාක්ෂණයන්, නවෝත්පාදනයන් සහ වෙළෙඳපොළ ඉලක්ක කරගත් නව සැලසුම් සංවර්ධනය කිරීම සඳහා ප්‍රබල ක්‍රියාවලියක් ලෙස පර්යේෂණ හා සංවර්ධනයේ වැදගත්කම රජය හඳුනා ගනී.

■ **සම්පත් කාර්යක්ෂමතාව**
පිරිවැය ඉතිරිකිරීම තුළින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ තරගකාරීත්වය වැඩිදියුණු කරන බැවින් සම්පත් කාර්යක්ෂමතාවයේ වැදගත්කම රජය හඳුනාගෙන ඇති අතර එය අනාගත සංවර්ධනය සඳහා තිරසාර පදනමක් පවත්වා ගැනීමට ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීමට උපකාරී වේ.

■ **කලාපීය සමතුලිතතාව**
සමස්ථ ආර්ථික සංවර්ධන උපාය මාර්ගයට අනුව සමතුලිත කලාපීය සංවර්ධනයේ වැදගත්කම රජය විසින් හඳුනාගෙන ඇති අතර ඒ සඳහා විවිධ දිරිගැන්වීමේ යෝජනා ක්‍රම සමඟ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මූල්‍ය හා මූල්‍ය නොවන ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් (BDS) සඳහා සැපයුම සහ ඉල්ලුම වැඩි දියුණු කරයි.

■ අවශ්‍ය පරිදි වෙළෙඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම.

■ සමන්ගේ ව්‍යාපාරයේ උපාය මාර්ගික දිශානතියට සහාය වීම සඳහා දක්ෂ කළමනාකරුවන් සහ සේවකයන් පිරිසක් බඳවා ගැනීම සහ රඳවා ගැනීම.

***(ලකුණු 04 යි)***



aat SRI LANKA

**(c)**

1 ඉතුරුම් සහ ප්‍රාග්ධන ගොඩනැගීම බල ගැන්වීමට.

2 එමගින් සමාගම්වලට ස්ථාවර ප්‍රාග්ධනය රැස්කර ගැනීමට හැකියාව ලැබේ.

3 එය නිෂ්පාදන අරමුණු සඳහා ඉතුරුම් අඛණ්ඩව ගලායාම සහතික කිරීම සහ ආයෝජන සඳහා අරමුදල් රැස් කිරීම සහතික කිරීම මගින් රටේ කාර්මික වර්ධනය සහ ආර්ථික සංවර්ධනය උත්තේජනය කිරීම.

4 එය සමාගම් / ආයතනවල කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ විශ්වාසදායක මාර්ගෝපදේශයක් ලෙස සේවය කිරීම.

5 මහජන යහපත සඳහා අරමුදල් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීම.

6 ඌන සංවර්ධිත ප්‍රදේශවල ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ අරමුදල් සැපයීම.

7 විදේශීය ආයෝජකයින් සහ ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීම සඳහා වේදිකාවක් නිර්මාණය කිරීම.

8 එය හොඳින් කළමනාකරණය කරන ලද, ලාභ ලබන සමාගම්වලට කලින් කලට නව කොටස් නිකුතුවක් මගින් අසීමිත අරමුදල් රැස් කිරීමට හැකියාව ලබා දීම.

9 හිඟ සම්පත් වඩා ප්‍රශස්ත ලෙස උපයෝජනය කරමින් ව්‍යවසායන් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට.

10 කොටස් වෙළෙඳපොළේ සුරැකුම්පත් විකිණීම හරහා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අරමුදල් රැස් කිරීමට රජයට හැකියාව ලැබේ.

**(ලකුණු 03 යි)**

**(මුළු ලකුණු 10 යි)**

**B කොටසෙහි අවසානය**

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː

*පරිච්ඡේදය 05 - ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම්, ව්‍යාපාරයකට ව්‍යාපාර ආචාරධර්මවල ඇති වැදගත්කම*

**(a)**

**1 රැකියා සඳහා දායක වීම/ රැකියා අවස්ථා ලබා දීම**

හැපි සුපර් යනු දිවයින පුරා අලෙවිසැල් 300කට අධික ප්‍රමාණයක් ඇති ශ්‍රී ලංකාවේ සුපිරි වෙළඳසැල් ජාලයක් වන අතර, අලෙවිසැල් වෙත සේවකයන් බඳවා ගැනීමෙන් රැකියා අවස්ථා සපයයි. ඊට අමතරව ගොවිපළවල රැකියා අවස්ථා වැඩි කිරීමට වක්‍රව උපකාර කරයි.

**2 දේශීය සම්පත් භාවිතය**

හැපි සුපර් කිරි ගොවීන්ගේ සහ එළවළු වගා කරන්නන්ගේ ජාලයක් දියත් කළ අතර ඔවුන්ට ඔවුන්ගේ නැවුම් එළවළු සහ කිරි නිෂ්පාදන පෙළක් ඔවුන්ගේ ළඟම ඇති හැපි සුපර් අලෙවිසැලට විකිණීමට හැකි වේ. එමගින් රටේ ආර්ථික සංවර්ධනය, ආර්ථික වර්ධනය සහ පූර්ණ රැකියා සඳහා දායකත්වය ඉහළ යනු ලබයි.

**3 පරිසරයට වන හානිය අවම කිරීම**

ව්‍යාපාරයේ සෑම ව්‍යාපාරික තීරණයක්ම සහ ක්‍රියාවකදීම පරිසර හිතකාමී ප්‍රවේශයක් කරා ගමන් කරන අතර එමගින් පාරිසරික හානිය අවම කරයි. හැපි සුපර් කාබනික ගොවීන් වෙත කාබනික පොහොර බෙදා හැරීම සලකා බලන අතර, ඔවුන්ගේ අලෙවිසැල්වලින් පිටවන කාබනික අපද්‍රව්‍ය භාවිත කරමින් ආයතනික සමාජ වගකීම (CSR) ව්‍යාපෘතියේ කොටසක් ලෙස කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට සැලසුම් කරයි.

**4 රජයේ ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති අනුගමනය කිරීම**

රජය කලින් වරින් වර ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ව්‍යාපාර බැඳී සිටී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය ෆිස්කල් ප්‍රතිපත්තිය තුළ අදාළ අනෙකුත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවසායකයින් විශාල දායකත්වයක් ලබා දේ. එලෙදායී ආකාරයෙන් කාබනික පොහොර භාවිත කිරීමේ රජයේ ප්‍රමුඛතාවය හැපි සුපර් විසින් ප්‍රවර්ධනය කරයි.

**5 ආර්ථික වර්ධනය සහ සංවර්ධනය**

හැපි සුපර් ගොවීන්ගේ සැබෑ ආදායම වැඩිදියුණු කිරීමට පහසුකම් සපයන අතර එය ආර්ථික වර්ධනයට බලපායි. එය ගොවීන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම මෙන්ම ආර්ථික සංවර්ධනය සඳහා සහාය වේ.

**6 සාධාරණ ආදායම් ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම**

හැපි සුපර් විසින් ගොවීන්ට වැඩි ආදායමක් ලබා දෙමින් එළවළු ගොවීන්ගේ දරිද්‍රතාවය අවම කිරීමේ

ව්‍යාපෘතියක් නිර්මාණය කරයි. ඔවුන්ට දිවයින පුරා කුඩා පරිමාණ එළවළු වගා කරන්නන් සහ කිරි ගොවීන් ජාලයක් ඇත.

**7 තිරසාර සංවර්ධනය**

හැපි සුපර් විසින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට සැලසුම් කරන අතර එය පරිසරය ආරක්ෂා කිරීමට උපකාරී වන නිසා එමගින් අනාගත පරපුරේ සෞඛ්‍යය ඉහළ නැංවීමට උපකාරී වේ.

**8 නිසි පරිදි බදු ගෙවීම**

රජයේ බදු පැහැර හැරීමකින් තොරව ඔවුන්ගේ ආදායම හෝ ලාභය මත පදනම්ව ව්‍යාපාර බදු ගෙවිය යුතුය. එමගින් රජයේ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීමට දායක විය හැකිය.

**9 නීතිරීති පිළිබඳ බැඳීම හා පිළිපැදීම**

ව්‍යාපාර රජය විසින් කලින් කලට පනවනු ලබන නීති රීති වලට අනුකූල විය යුතුය. එය යහපත් ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීමට ව්‍යාපාරවලට උපකාරී වේ.

***(ලකුණු 05 යි)***

| ***පරිච්ඡේදය 02 - ව්‍යාපාර පරිසරය සහ ව්‍යාපාර සංවිධානවලට එහි බලපෑම*** |
|---|

**(b)**

PESTEL විශ්ලේෂණය යනු සංවිධානයක මෙහෙයුම් සඳහා බාහිර පාරිසරික බලවේගවල බලපෑම විශ්ලේෂණය කිරීමේ මෙවලමකි. එය සාර්ව පරිසරය තුළ දේශපාලන, ආර්ථික, සමාජ-සංස්කෘතික, තාක්ෂණික, පාරිසරික සහ නෛතික බලවේග නියෝජනය කරයි. ලබා දී ඇති තොරතුරු අනුව, බාහිර ව්‍යාපාරික පරිසරයේ බොහෝ බලවේග හැපි සුපර් සඳහා හිතකර බව තක්සේරු කර සටහන් කළ හැකිය.

1 **දේශපාලන පරිසරය** - කාබනික ගොවීන් වෙත කාබනික පොහොර බෙදා හැරීමේ ආයතනික සමාජ වගකීම (CSR) ව්‍යාපෘතියක් ආරම්භ කිරීමෙන් රජයේ ප්‍රමුඛතා සමඟ හැපි සුපර් පෙළගැස්වෙන බැවින් මෙය හිතකර වේ.

2 **ආර්ථික පරිසරය** - මෙය පාරිභෝගික මිලදී ගැනීමේ හැකියාව, ආදායම් මට්ටම, නිෂ්පාදනය සහ මිල මට්ටමෙන් සමන්විත වේ. තම අලෙවිසැල්වල ඇති කාබනික අපද්‍රව්‍ය යොදා ගනිමින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇති බැවින් හැපි සුපර් රටේ ආර්ථික ප්‍රමුඛතා සහ අනාගත අවශ්‍යතා සමඟ සමපාත වන බැවින් මෙයද හිතකරය.

3 **පාරිසරික පරිසරය** - පරිසර හිතකාමී අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ස්වභාවධර්මය සංරක්ෂණය කිරීම සහතික කරන නිසා මෙය හැපි සුපර් හි හිතකර වේ.

4 **සමාජ-සංස්කෘතික පරිසරය** - සමාජයේ වෙසෙන මිනිසුන්ගේ මූලික විශ්වාස අගනාකම් හෙවත් වටිනාකම් අපෙක්ෂා සමාජාවරණයන් හා සංජානනයන් යනාදිය මෙම පරිසරයට අයත් මූලික සමජයීය සාධකයක් වන අතර මේවා ඍජුවම ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරයි. හැපි සුපර් විසින් මිනිසුන් අපේක්ෂා කරන ආකාරයට සමාගම කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට පියවර ගනී.

5 **තාක්ෂණික පරිසරය** - හැපි සුපර් විසින් අවශ්‍ය තාක්ෂණය සඳහා ආයෝජනය කර ඇති අතර කර්මාන්තයේ සහයෝගීතාවයෙන් ගොවීන්ට අදාළ තාක්ෂණික දැනුම ලබා දෙන බැවින් මෙම පරිසරය හිතකර වේ.

6 **නෛතික පරිසරය** - කාබනික පොහොර සහ සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛතාවයන් සඳහා රජය විසින් සුදුසු නෛතික හා ආයතනික රාමුවක් ස්ථාපිත කරන බැවින් මෙය අහිතකර නොවන බව පෙනේ.

***(ලකුණු 06 යි)***

| *පරිච්ඡේදය 05 - ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම්, ව්‍යාපාරයකට ව්‍යාපාර ආචාරධර්මවල ඇති වැදගත්කම* |
|---|

**(c)**

1 ව්‍යාපාරය කටයුතු කරගෙන යාම සඳහා සමාජයෙන් සහය ලැබීම.
2 ව්‍යාපාරයේ ප්‍රතිරූපය වර්ධනය වීම.
3 අනාගත කොටස්කරුවන්ගේ ආකර්ෂණය ලබා ගැනීමට හැකි වීම.
4 ව්‍යාපාරයට හිතකර අංශ අතර අන්තර් රැඳියාව වර්ධනය වීම.
5 සමාජ වගකීම් ඉටු කරන හෙයින් රජයේ පාලනය අවම වීම.
6 බදු නිදහස් කිරීම් / බදු ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලැබීම.
7 යහපත් සමාජ පරිසරයක් ගොඩනැගෙන නිසා ව්‍යාපාරවලට අවශ්‍ය යෙදවුම් මෙන්ම වෙළෙඳපොළ ද පහසුවෙන් ලබා ගත හැකි වීම.

***(ලකුණු 03 යි)***

| *පරිච්ඡේදය 05 - ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම්, ව්‍යාපාරයකට ව්‍යාපාර ආචාරධර්මවල ඇති වැදගත්කම* |
|---|

**(d)**

අනාගත පරම්පරාව නිදහසේ ජීවත් වීමටත් තම ව්‍යාපාර කටයුතු පරිසර හිතකාමී ලෙස කිරීමටත් උපකාර වන සංවර්ධන සැලැස්මක් ලෙස පරිසර තිරසාරභාවය සැලකිය හැකිය. ව්‍යාපාරය සහ පරිසරය අතර දීර්ඝ කාලීන සම්බන්ධීකරණය සහ සම්බන්ධතාව පවත්වාගෙන යාමේ පාලමක් ලෙසද මෙය සැලකිය හැකිය.

සිද්ධියට අනුව, හැපි සුපර් පාරිසරික තිරසාරත්වය සහතික කිරීම සඳහා පහත සඳහන් අංශ වෙත නිරත වී ඇත.

1 කාබනික ගොවීන්ට කාබනික පොහොර බෙදා හැරීම.
2 තම අලෙවිසැල් වල ඇති කාබනික අපද්‍රව්‍ය භාවිත කර කාබනික පොහොර නිෂ්පාදනය කිරීම.

3 කාර්මික සහයෝගීතාවයක් හරහා අවශ්‍ය ගොවීන්ට අදාළ තාක්ෂණික දැනුම ලබා දීම.

4 ප්‍රවාහනයේදී ආහාර නාස්තිය අවම කිරීම සහ අතරමැදියන් උපයන කොමිස් මුදල් ඉවත් කිරීම හරහා කුඩා පරිමාණ ගොවීන්ට ඉහළ ආදායමක් සහතික කිරීම සඳහා කිරි ගොවීන්ගේ සහ එළවළු වගාකරුවන්ගේ ජාලයක් පිහිටුවීම.

5 කිසිම ස්ථානයක පරිසර දූෂණයක් සිදු නොකිරීම.

6 රටේ සංස්කෘතිය විනාශ කරන කිසිම ක්‍රියාකාරකමක් නොකර සිටීම සහ නොයෙදීම.

7 ජෛව විවිධත්වය විනාශ කරන කිසිදු ගිවිසුමක් අත්සන් නොකිරීම.

8 ස්වභාවික පාරිසරික කලාප විනාශ වන ආකාරයෙන් ලාභය උපයන ඉපැයීම් අඩු කිරීම.

*(ලකුණු 04 යි)*

| *පරිච්ඡේදය 07 - ව්‍යවසායකත්වයේ දායකත්වය* |
|---|

**(e) ව්‍යවසායකයෙකුට අවශ්‍ය ව්‍යවසායකත්ව කුසලතා**

1 නායකත්ව කුසලතා

2 අන්තර් පුද්ගල කුසලතා

3 සන්නිවේදන කුසලතා

4 මූලික කළමනාකරණ කුසලතා

5 සංකල්පීය කුසලතා

6 දාර්ශනික කුසලතා

*(ලකුණු 02 යි)*

*(මුළු ලකුණු 20 යි)*

aat SRI LANKA

**C කොටසෙහි අවසානය**

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the “Only” answers, or, for that matter even as “Model Answers”. The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*